ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා, ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ මොරිෂස් රාජ්‍යයේ අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් ජුග්නෝත් මැතිතුමා ශ්‍රී ලංකාවේ සහ මොරිෂස් හි UPI සේවා දියත් කිරීමේ වැඩසටහනට එක් වේ.</u>

අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා, ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ මොරිෂස් රාජ්‍යයේ අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් ජුග්නෝත් මැතිතුමා ශ්‍රී ලංකාවේ සහ මොරිෂස් හි ඒකාබද්ධ ගෙවීම් පද්ධති සේවාවන් සහ මොරිෂස් හි Rupay කාඩ් සේවාවන් දියත් කිරීමේ වැඩසටහන සඳහා 2024 පෙබරවාරි 12 වන දින පස්වරු 1ට වීඩියෝ තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වනු ඇත.

2. ඉන්දියාව මූල්‍ය තාක්ෂණ නව්‍යකරණය සහ ඩිජිටල් පොදු යටිතල පහසුකම් ක්ෂේත්‍රය තුළ නායකයකු ලෙස පෙරට පැමිණ ඇත. අපගේ සංවර්ධන අත්දැකීම් සහ නව්‍යකරණය සහකාර රටවල් සමඟ බෙදා ගැනීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යතුමා දැඩි අවධානයක් දක්වයි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මෙන්ම ඉන්දියාව සහ මොරිෂස් රාජ්‍යය සමඟ පවතින ශක්තිමත් සංස්කෘතික සහ ජනතාව අතර බැඳීම් හේතුවෙන් UPI සේවා මෙම රටවල දියත් කිරීම වඩා වේගවත් සහ සුමට ඩිජිටල් ගෙවීම් අත්දැකීමක් හරහා විශාල ජනතාවකට සෙත සලසනු ඇති අතර රටවල් අතර ඩිජිටල් සම්බන්ධකතාවය ඉහළ නංවනු ඇත.

3. මෙම වැඩසටහන දියත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවට සහ මොරිෂස් රාජ්‍යයට පැමිණෙන ඉන්දීය ජාතිකයන්ට මෙන්ම ඉන්දියාවට පැමිණෙන මොරිෂස් ජාතිකයන්ට UPI පියවීම් සේවා භාවිතා කිරීමට හැකි වනු ඇත. මොරිෂස් රාජ්‍යය තුළ RuPay කාඩ් සේවා ඇරඹීම මොරිෂස් බැංකුවලට මොරිෂස් හි RuPay යාන්ත්‍රණය පදනම් කරගෙන කාඩ්පත් නිකුත් කිරීමට අවස්ථාව ලබා දෙනු ඇති අතර ඉන්දියාව සහ මොරිෂස් රාජ්‍යය තුළ පියවීම් සඳහා RuPay කාඩ්පත් භාවිතා කිරීමට අවකාශ විවර කරනු ඇත.

***

***කොළඹ***
***2024 පෙබරවාරි 12***